**නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------------**

නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2011 දෙසැම්බර් 27 දින එළඹී අංක ටීඑෆ් 099870 දරන ප්‍රදාන ගිවිසුමේ 11 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විවිධිධාන ප්‍රකාර මාගේ විධිවිධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, මුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

නිමවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩි කිරීම හා ගෘහස්ථ මට්ටමින් ස්ථානීය සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩි දියුණු කිරීම වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,537.15 කට සමාන එ.ජ.ඩො.මිලියන 12.93 ක් වන අතර ඉන් රු.මිලියන 561.81 කට සමාන එ.ජ.ඩො.මිලියන 4.89 ක් මූල්‍යනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ජේදය 2019 මාර්තු 31 දක්වා 3 න් වතාවක් දීර්ඝ කර ඇත.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දින දක්වා ගෙවා ඇති එකතුව රුපියල් මිලියන 187.06 ක් වූ එකතු කළ අගය මත බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙනම පෙන්වනවා වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකත්වයට එරෙහිව හිලව් කර තිබුණි. | රජයේ දායකත්වය අඩුවෙන් දැක්වීම | එකතුකළ අගය මත බදු වටිනාකම, රජයෙන් ලැබෙන දායකත්වයට එරෙහිව හිලව් කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපත්තියකි. මෙම කරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලයට යොමු කරන ලද අතර ඔවුන්ගේ උපදෙස් ඇමුණුම 01 අමුණා ඇත. | රජයේ සමස්ථ දායකත්වය පිළිබිඹු වන පරිදි අදාළ පිරිවැය මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ලෝක බැංකුවෙන් මහා භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කළහැකි විදේශ ප්‍රදාන ලෙස රුපියල් මිලියන 198.93 ක් ලැබුණද, ඉන් රු.මිලියන 71.4 ක් පමණක් ව්‍යාපෘතියට ලැබී ඇති අතර ඉතිරි මුදල වූ රු.මිලියන 127.53 මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට පෙන්වා නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව එම වටිනාකමින් ලෝක බැංකු ප්‍රදාන ගිනුම අඩුවෙන් දැක්වේ. | ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වයෙහි ලෝක බැංකු ප්‍රදානය රු.මිලියන 127.53 කින් අඩුවෙන් දැක්වේ. | රු.මිලියන 198.92 ක් මහා භාණ්ඩාගාරයට ලැබී ඇති අතර, කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන මණ්ඩලයට තවමත් රු.මිලියන 137.74 ලැබී නොමැත. එසේම මෙය මහ භාණ්ඩාගාරය විසින් ජාතික ජලසම්පාදන මණ්ඩලය වෙත ගෙවිය යුතු ලෙස සටහන් කර නොමැත. ව්‍යාපෘති කාලයෙන් පසු මෙය භාවිතා කල නොහැකි නිසා භෞතිකව ලැබුණු මුදල ප්‍රදාන ලෙස සටහන් කරන ලදී, | ලෝක බැංකු ප්‍රදානයේ සමස්ථ දායකත්වය පිළිබිඹු වන පරිදි අදාල ප්‍රදාන මුදල මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය. |
| (ඇ) | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 45 වන වගන්තියට අනුකූලව විදේශ ප්‍රදාන සහ රජයේ ප්‍රදානයන් වෙන වෙනම අනාවරණය කර නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි 45 ඡේදයට අනුකූල නොවීම. | භෞතිකව ලැබුණු විදේශ ප්‍රදාන රු.මිලියන 563,188 ක් වන අතර රජයේ ප්‍රදාන රු.මිලියන 569.97 කි. ඇමුණුම 2 හි විස්තර දක්වා ඇත. | ශ්‍රී.ලං.ගි.ප්‍ර. 01 හි විධිවිධාන අනුගමනය කිරීමට පියවර ගත යුතුය |

## 3. භෞතික කාර්යය සාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්හි භෞතික කාර්ය සාධනය

නිමවුම් 01 යටතේ මලාපවහන සම්බන්ධතා ඒකක 13,107 ක් ලබා දීමට නිමවුම් 02 යටතේ ස්ථානීය වැඩිදියුණු කිරීම් ඒකක 2,300 ක් ලබා දීමට ව්‍යාපෘතිය මූලිකව සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, පසුව මලාපවහන සම්බන්ධතා හා ව්‍යාපෘති පිරිවැය ඉහල යාම නිසා නිමවුම් 01 යටතේ මලාපහන සම්බන්ධතා සංඛ්‍යාව 13,107 සිට 5,015 දක්වා ද නිමවුම් 02 යටතේ ස්ථානීය වැඩිදියුණු කිරීම් සංඛ්‍යාව 2,300 සිට 3,785 දක්වා ද සංශෝධනය වී තිබුණි.

| සංරචක | ක්‍රියාකාරකම් | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්යය සාධනය | | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාරයන් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | තථ්‍ය | | | |
| (අ.) මලාපවහන සම්බන්ධතා (නිමවුම - 01) | සම්බන්ධතාවයන් | 5,015 | 4,793 | ව්‍යාපෘති කාලපරිච්ඡේද අවසානයේදී ඉලක්ක සපුරා ගෙන නොමැත | මොරටුව/රත්මලාන,ජාඇල/ඒකල ව්‍යාපෘතිය මඟින් මොරටුව රත්මලාන ප්‍රධාන මලාපවහන අර්ධ වශයෙන් නිම කිරීම හේතුවෙන් පරිශ්‍රය තුළ නිමවුම් 1a2 සම්බන්ධතාවයන් 750 සිට 386 දක්වා අඩු කරන ලදී. නමුත් නිමවුම් 1c1 සහ නිමවුම 1c1 ඉලක්ක ගත ප්‍රමාණයට වඩා වැඩි සම්බන්ධතා 173ක (මුළු 898) ප්‍රමාණයක් නිමවුම් 1a1 මඟින් සහ අතිරේක සම්බන්ධතා 32 ක් (මුළු 1,115) නිමවුම් 1c1 තුළින් ලබාදී ඇත. නිමවුම් 1 යටතේ සම්බන්ධතා 4,793 ක් ලබා දී ඇති අතර එය ඉලක්කයට වඩා වැඩිවීම සියයට 95.57 කි. නිසිලෙස සැලසුම් කරනු ලැබූ සරල කරන ලද මලාපවහන දිගුවක් සහ විමධ්‍යගත අපජල පිරිපහදු පද්ධති (වි.අ.පි.ප.) සහ නව නවෝත්පාදන ප්‍රවේශයන් හඳුන්වා දීමෙන් මෙම | ව්‍යාපෘති කාලය තුළ අදාල ඉලක්ක සපුරා ගැනීමට වහාම පියවර ගත යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඉලක්කය සපුරා ගන්නා ලදී. ඊට අමතරව නිමවුම් පාදක ආධාර (නි.පා.ආ.) මූල්‍යකරණ ප්‍රවේශය සහ නව තාක්ෂණික ප්‍රවේශයන්වල යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. |
| (ආ.) ස්ථානීය වැඩි දියුණු කිරීම් (නිමවුම - 02) | මලාපවහන පිරිපහදු කිරීමේ ඒකක ස්ථාපනය කිරීම් | 3,785 | 3,554 | නිමවුම් 2 ස්ථානීය සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ සංරචකය, මධ්‍යගත හෝ විමධ්‍යගත පද්ධති ශක්‍ය නොවන තදාසන්න හා විසුරුණු ප්‍රදේශවල සනීපාරක්ෂාවට විසඳුමක් ලබා දීම සඳහා වූ නව ප්‍රවේශයකි. මෙම ව්‍යාපෘතිය තුල රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව නියමුකරණ නව ක්‍රමය පවත්වාගෙන යාම සඳහා නව තාක්ෂණික ප්‍රවේශය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභී කුටුම්භයන් 3,500 කට වඩා වැඩි ප්‍රමාණයක් තෝරා ගැනීමට මහජනතාව හා අනෙකුත් පාර්ශවකරුවන් ඒත්තු ගැන්වීම මෙම ව්‍යාපෘතිය සිදුකල යුතුව තිබුණි. ස්ථානීය සනීපාරක්ෂක වැඩිදියුණු කිරීමේ සංරචක ව්‍යාපෘතිය සඳහා නව සැලසුම් හා තාක්ෂණය භාවිතා කිරීමේදී, පූර්ව අත්දැකීම් නොතිබීම නිසා දුෂ්කරතා විසඳමින් ව්‍යාපෘතිය ක්රියාත්මක කිරීමට සිදුවිය. වැඩබිම කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කොට්ඨාශ 07 ක ස්ථාන 3,554 ක විසිරී පැවතිණි. ඉහත නව අභියෝගයන් මධ්‍යයේ වුවද, පහසුකම් 3534 ක් ලබා දී ඇත. |

**3.2 මත භේදයට තුඩු දෙන කරුණු**

| | විගණන නිරීක්ෂන | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු මාසයේදී අවසන් කර ඇති අතර ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ප්‍රදානය සඳහා අයදුම් කිරීමේ අවසාන දිනය 2019 ජුලි මස විය. කෙසේ වෙතත් 2020 ජුනි 30 දින දක්වා වත්කම් ප්‍රාග්ධනිත කර අවසන් කිරීමේ ගිණුම් සකස් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අවසන් කිරීමේ ගිණුම් සැකසීම ප්‍රමාද වීම | ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධනිත කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර 2020 වර්ෂය තුළ සියළුම ප්‍රාග්ධනිත කටයුතු අවසන් කරනු ඇත. | ප්‍රමාදයකින් තොරව වත්කම් ප්‍රාග්ධනිත කිරීමට සහ අවසන් ගිණුම් සකස් කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ආ) | 2019 මැයි 21 දින විදේශ ප්‍රදානයේ අවසාන ප්‍රතිපූර්ණය ලැබී තිබුණද, 2020 ජුනි 30 දින දක්වා ස්ථානීය සනිපාරක්ෂක වැඩිදියුණු කිරීමේ 3c ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් පියවීමට පියවර ගෙන නොතිබුණි. | අවසන් කිරීමේ ගිණුම් සැකසිම ප්‍රමාද වීම | කොන්ත්‍රාත්තුවේ අවසාන බිල්පත කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලදී. රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීම් සඳහා සියලු අඩුපාඩු නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබාදී ඇත. | ප්‍රමාදයකින් තොරව හිඟ බිල්පත් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3.3 පද්ධති හා පාලන**

| | විගණන නිරීක්ෂන | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | 2010 ජුලි 05 දිනැති කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොමැත. | ව්‍යාපෘතියේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වල දුර්වල පාලනය ව්‍යාපෘති කාර්ය සාධනය සඳහා අහිතකර ලෙස බලපෑ හැකිය. | 2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය සිදු කරන ලදී. (ලිපිය අමුණා ඇත.) සහ වාර්තාව 2019 පෙබරවාරි 06 දින ජාතික ජලසම්පාදන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලදී. 2019 වර්ෂය සඳහා 2020 වර්ෂයේ පළමු කාර්තුවේදී අවසාන විගණනය ආරම්භ කරන ලද අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විගණන කටයුතු ප්‍රමාද විය. අවසාන විගණනය සිදු කරනු ලබන අතර අභ්‍යන්තර විගණන අංශය විසින් වාර්තාව හැකි ඉක්මනින් ඉදිරිපත් කරනු ඇත. | අභ්‍යන්තර විගණනය සිදු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | වියාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛණ නිසියාකාරව පවත්වා ගෙන ගොස් නොමැති අතර මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වියාපෘතිය විසින් 2019 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සම්බන්ධ දුර්වල පාලනය වියාපෘති කාර්ය සාධනයට අහිතකර ලෙස බලපෑ හැකිය. | සෘජුවම මිලදී ගත් අයිතම වත්කම් ලේඛණයක පවත්වා ගෙන යනු ලැබූ අතර කොන්ත්‍රාත්තු මහින් භාරදුන් භාණ්ඩද වත්කම් ලේඛණයට ඇතුලත් කර ඇති අතර සියලුම භාණ්ඩ ජාතික ජල සම්පාදන මණ්ඩලයට මාරු කරනු ලැබේ. 2015 වර්ෂය තුළ ස්ථාවර වත්කම් සත්‍යාපනය සිදුකරන ලද අතර, ඉදිරියේදී ස්ථාවර වත්කම් සත්‍යාපනය සිදු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛණය නිසියාකාරව පවත්වා ගැනීමට හා කාලීනව ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීමට පියවර ගත යුතුය. |